## 01 : 1 හැඳින්වීම

මේ ගෙවී යන්නේ චලන චිත්‍රයේ යුගයයි. මුද්‍රණය කළ වචනය අභිබවා චලනය වන රූපය හරහා මානව ජීවිතයේ සෑම සංවේදනයක්ම සංස්පර්ශ කෙරෙන්නා වූ කාලයයි, අති නවීන දියුණු තාක්ෂණය, සෞන්දර්යය හා මුසු වෙමින් නිර්මාණාත්මක ප්‍රකම්පනයක් ඇති කරන්නා වූ කාලයයි. මෙකී කාලයේ සම්භාවනීය ප්‍රමුඛයා ලෙසින් වැජඹෙන්නේ සිනමාවයි. සන්නිවේදන කලා මධ්‍යයන් කොතෙකුත් අතර පතාකයෙකු සේ ආධිපත්‍ය පතුරන්නේ සිනමා මාධ්‍යයයි.

තාක්ෂණික සොයා ගැනීම් වලින් ඔබ්බට ගොස් සිනමාවේ සෞන්දර්යය ඉස්මතු කර ගත් තැන පටන් රසාස්වාදනය මෙන්ම විචාරය ද ඒ හා සුසංයෝගී විය. විචාරය හා රසාස්වාදය කලා නිර්මාණ හා බැඳී පවතී. කලා නිර්මාණයක් වශයෙන් සිනමාව වර්ධනය වෙත් දී සිනමාව පිළිබඳ විචාරය ද ඊට සමගාමීව මුහුකුරා ගියේ එබැවිනි. නිර්මාණයක් නොමැති තැන විචාරයක් ද නැත. එබැවින් නිර්මාණ ක්ෂේත්‍රයේ දි සැම විටම පාහේ විචාරය ද්විතිකව පිළිගැනෙන්නක් වේ. නමුත් විචාරය කලාවට උරුම, අත්‍යවශ්‍ය අංගයකි. මෙනයින් සිනමා විචාරය, නිර්මාණාත්මක සිනමාවේ ප්‍රගමනයට අත්‍යවශ්‍ය වන්නා වූ ක්‍රියාවකි. සිනමාවෙන් පෝෂණය වන විචාරය, එපරිද්දෙන්ම සිනමාවේ ප්‍රතිපෝෂණය කෙරෙහි ද පුරෝගාමී වේ.

සිනමා විචාරය  යනු සිනමා කෘතියක් දෙස විනිවිද දක්නා ඥානයෙන් බැලිය හැකි, පරිචයෙන් පිරිමැදිය යුතු සහජ කුසලතාවයක් වේ. සිනමා ක්ෂේත්‍රය පිළිබඳ සුවිශේෂී පුහුණුවක් ලද, අදාළ ක්ෂේත්‍රයේ ප්‍රමාණික විද්වතුන් විසින් නිර්මාණ අරඹයා කරන්නා වූ තර්කානුකූල ප්‍රකාශ සිනමා විචාර ලෙස සැලකිය හැකිය. සිනමාව පිළිබඳ රසිකත්වයක් දක්වන ඕනෑම ප්‍රබුද්ධ ප්‍රේක්ෂකයෙකුට සිනමා විචාරකයෙකු විය හැකි බවට විවාදයක් නැත. අවශ්‍ය වන්නේ සිනමාව පිළිබඳ ප්‍රගුණ කර ගත් දැනුම හා මනා අවබෝධය පමණකි. කෙසේ වූව ද 'හොඳ' ප්‍රේක්ෂකයෙකු නොවන තාක් කල් බුද්ධිමතෙකුට වූව ද සාර්ථක විචාරකයෙකු බවට පත් විය නොහැකිය.

සිනමාවට විචාරයක් අවශ්‍ය වන්නේ සිනමා කෘතිය හා ප්‍රේක්ෂකයා අතර පවතින පරතරය අවම කිරීමටය. විචාරකයා ද තවත් එක් ප්‍රේක්ෂකයෙකු පමණක් වූවත්, සාමාන්‍ය පොදු ප්‍රේක්ෂකයාට වඩා එහා ගිය තියුණු වින්දන ශක්තියක් ඔහු සතු විය යුතුය. "සිනමා විචාරකයා යනු රසිකයාට මග පෙන්වමින් ඔහුගේ රසඥතාව ඔප් නැංවීමට හා වර්ධනය කිරීමට කටයුතු කරන්නෙකි. එහෙයින් සිනමා විචාරකයා යනු සාමාන්‍ය රසිකයෙකු පමණක් නොවේ. සාමාන්‍ය රසිකයා නොදකින දේ ඔහු දකී. ඔහු තෙවැනි ඇසක් ඇත්තෙකි. විචාරකයෙකු වීමට රසඥතාවක් මෙන්ම අදාළ ක්ෂේත්‍රයේ බහුශ්‍රැතභාවයක් ද තිබිය යුතුය. හොඳ සිනමා විචාරකයෙකු වීමට සිනමාව ගැන පුළුල් අවබෝධයක් පැවතිය යුතුය. සිනමාව ගැන පමණක් නොව පෙර අපර දෙදිග විචාර සිද්ධාන්ත ගැන ද අවබෝධයක් තිබිය යුතුය." [1] (රත්නායක 2008, පි.78)

සිනමා නිර්මාණයක් විචාරය කිරීම පිළිබඳව තහවුරු වූ හෝ පිළිගත් ඒකායන මාර්ගයක් හෝ ප්‍රවිශ්ටයක් නොමැති බැවින් විචාරය පුද්ගලයාගෙන් පුද්ගලයාට මෙන්ම නිර්මාණයෙන්

නිර්මාණයට ද වෙනස් ස්වරූප ගනී. එසේ වුව ද විචාරය පිළිබඳ ලෝක සම්මත රීතීන් මෙන්ම නව්‍ය විචාර ප්‍රවනතාවන් ද සිනමා විචාරය කෙරෙහි ඉවහල් කර ගැනේ. දෘෂ්ටිවාදයන් හරණය කළ තාර්කික විචාරයන් නිර්මාණය කෙරෙහි මෙන්ම පොදු ප්‍රේක්ෂකයා කෙරෙහි ද යහපත්, සාධනීය බලපෑමක් සිදු කරයි. විචාරය කිසි විටෙකත් මතවාදී ප්‍රකාශනයක් නොවිය යුතු අතරම විවේචක මෙවලමක් ද නොවිය යුතු වේ. "හොඳම විචාරකයා නම්, දුබල නිර්මාණ වල දී එහි වැරදි බවත්, හොඳ නිර්මාණ වල දී එහි හරි බවත් දක්වන බුද්ධිමත් විචාරකයා'යි වරක් ජෝර්ජ් බර්නාඩ් නමැති විචාරකයා පැවසීය. "[2] (ජයතිලක 1999, පි. 51) විචාරය නිර්මාණයට ඉදිරියෙන් හෝ පසුපසින් නොව, නිර්මාණය හා සමාන්තරව හිඳිමින් ඉදිරි පියවරක් තැබීම සඳහා නිර්මාණයට පිටුබලයක් විය යුතුය.

ලාංකේය සිනමා නිර්මාණ අරඹයා තවමත් පරිණත වූ විචාර සම්ප්‍රදායක් ගොඩ නැඟී ඇති බව පෙනෙන්නට නොතිබුණ ද අමරිකාව, බ්‍රිතාන්‍ය ප්‍රමුඛ බටහිර රටවල සිනමා විචාර කලාව බෙහෙවින් දියුණු තත්වයක පවතී. විචාරය පිළිබඳ බටහිර සතු සාම්ප්‍රදායික මිනුම් දඬු මෙන්ම නව්‍ය විචාරවේදී ප්‍රවේශයන් ද ඒ කෙරෙහි රුකුලක් වී ඇති බව පෙනෙන්නට තිබේ. බටහිර සිනමා නිර්මාණකරුවන්ගේ අදහස වන්නේ නිර්මාණයක් කෙරෙහි වැඩි ප්‍රේක්ෂක අවධානයක් දිනා ගැනීමට විචාරය අත්‍යවශ්‍ය සාධකයක් වන බවයි. නැරඹීම සඳහා චිත්‍රපටයක් තෝරා ගැනීම පිණිස මෙන්ම, නිර්මාණ ගැඹුරින් රසවිඳීම සඳහා ද සිනමා විචාර පුරුද්දක් ලෙස කියවීමට ඇමරිකානු සිනමා ප්‍රේක්ෂකයින් බහුතරයක් යොමු වී සිටින බව සොයා ගෙන තිබේ. විචාරය යන්න බටහිර සමාජයන්හි දී මානසිකව සාමාන්‍යකරණය වූ ක්‍රියාවක් වීම මෙයට හේතුවක් විය හැකි ය.

සිනමා විචාරය සම්බන්ධයෙන් පමණක් නොව, පොදුවේ විචාරය සම්බන්ධයෙන් වර්ධනය වූ ආකල්පයක් ලාංකේය සමාජය තුළ ස්ථාපිත වී නොමැති තරම්ය. සම්ප්‍රදාය, සදාචාරය, ආගම, විශ්වාස හා ඇදහිලි ආදී වූ ගූඪ මානසික තලයන් තුළ හිර වී සිටින නිසාවෙන් දෝ තාර්කිකව ගොඩ නගා ගත් විචාරාත්මක චින්තනයට ප්‍රවිෂ්ට වීම තරමක් අසීරු වී තිබේ. ලාංකේය සිනමා විචාරයේ ඓතිහාසික ගමනට දශක හතක පමණ ඉතිහාසයක් තිබෙන නමුත් දෘෂ්ටිවාදයන් බැහැර කළ සාර්ථක විචාරක නිර්ණායක අත්පත් කර ගත් විචාරයන් දක්නට ලැබෙන්නේ අතළොස්සකි. සිනමාව දාර්ශනික මානයකින් විග්‍රහ කිරීමට ගත් උත්සහායන් ඒ අතර වේ. සිනමාවට සමගාමී ව හරවත් විචාර සම්ප්‍රදායක් ස්ථාපනය කිරීමට ආධ්‍යාශයෙන් කටයුතු කළ පිරිසක් ද සිටි බව අමතක කළ යුතු නොවේ. නමුත් එකී ප්‍රයත්නයන් මැනවින් තහවුරු වූ බවක් නොපෙනේ. විශේෂයෙන්ම, විචාරය පිළිබඳව සමාජගත වී ඇති ආකල්ප, විචාරය පිළිබඳ විද්‍යානුකූල පදනමක් නොවීම මෙන්ම විචාරයට වෘත්තීයමය තත්වයක් නොතිබීම ද මෙයට හේතු වී තිබේ. එසේම සමස්තයක් වශයෙන් ගත් කළ සංඥාර්ථවේදය, ස්ත්‍රීවාදය, ව්‍යුහවාදය, පශ්චාත් නූතනවාදය, මනෝ විශ්ලේෂණවාදය, මාක්ස්වාදය වැනි විචාරාත්මක එළඹුම් කෙරෙහි ආගන්තුකභාවයක් දැක්වීම ද, සිනමාව කියවීමේ ශික්ෂණය හඳුනා නොගැනීම හෙවත් සිනමාව වියමනක් ලෙස කියවීමේ හුරුව නොතිබීමද ලාංකේය සිනමා විචාරයේ තවදුරටත් පවත්නා ඌනතාවන් වේ. ලාංකේය සමාජය තුළ සිනමාව හුදෙක් 'බැලීමේ' මිස 'කියවීමේ' මාධ්‍යක් ලෙස හඳුනා නොගැනීමේ ඛේදවාචකය සිනමා විචාරය දක්වාම දිගුව තිබේ.